# Living the Lotus

4
2022

VOL. 199

Buddhism in Everyday Life




Founder's Reflections

## බුදුන් වහන්සේව බැහැදකින්නාවූ පුද්ගලයන්

බුදුන් වහන්සේ, දුර ඈත ගම්දනව් වල සිට උන් වහන්සේව බැහැදැකීමට එන ශ්‍රාවකයන්ගෙන්, ''ගමන් මග දුෂ්කරද, ආහාරපාන වලින් අඩුවක් වුනාද, ඔබලාගේ මිත්‍රන් සියල්ලෝම හොඳින් නේද'' යැයි නිසකවම විමසා සිටියා.

එක් දිනක් බුදුන් වහන්සේ බැහැදැකීමට පැමිණි ශ්‍රාවක පිරිසකගෙන් බුදුන් වහන්සේ සුපුරුදු පරිදි ''ඔබලා හොඳින් නේද'' යැයි විමසූ විට, ඒ අතරින් එක් අයෙක්, ''සැබෑවටම මාගේ මිත්‍රයෙක් හදිසියේම අසනීප වුනා, නමුත් ඔබ වහන්සේව කෙසේ හෝ බැහැදැකීමට අවශ්‍යය වූ නිසා, මම මිතුරාව තනිකර දමා පැමිණියා'' යැයි පවසා සිටියා. එවිට බුදුන් වහන්සේ, ''මාව බැහැදැකීමට එනවාට වඩා, අසනීපව සිටින මිතුරාව තනි නොකර ඔහුට සත්කාර කරන පුද්ගලයා, මම සැතපුම් දහස් ගණනක් දුරින් සිටියත්, ඔහු මාව බැහැදකී'' යැයි පැවසුවා.

මාගේ රූපය බැහැදැකීමට එනවාට වඩා, මාගේ ප්‍රාර්ථනාවන් තමාගේම ප්‍රාර්ථනාවන් සේ සළකා කටයුතු කරන පුද්ගලයන්, මාගේ සැබෑම ශ්‍රාවකයන්, යැයි දේශණා කලා.

අපි බුදුන් වහන්සේට වැද නමස්කාර කරන්නේ, බුදුන් වහන්සේගේ හදවත බඳු වූ හදවතක් බවට අපේ හදවත පත්කරගැනීමට ඕනා යන ප්‍රාර්ථනාව නිසාය. රෝගාතුරව දුකින් පීඩාවට පත්ව සිටින පුද්ගලයෙකු දුටු විට, දෑස් පියාගෙන නොදැක්කාසේ, උදව් නොකර සිටිය නොහැකි හදවත බුදුන් වහන්සේගේ හදවත බඳු වූ හදවතයි. අපි අන් සෑම දෙයකටම ප්‍රථමයෙන් රෝගාතුරව දුකින් පීඩාවට පත්ව සිටින පුද්ගලයන්ව දුකින් මුදවාලීමට කටයුතු කරමු.

නිර්මාතෘ සංකල්පනා ග්‍රන්ථය ඇසුරිනි. 10, P. 222-223

රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය 1938 වර්ෂයේදි නික්යෝ නිවානෝ තුමා හා මියාකෝ නගනුමා මහත්මිය විසින් ස්ථාපිත කරන ලදී. සද්ධර්ම පුණ්ඩරීක සූත්‍රය මූලික කරගෙන එහි කටයුතු කරනු ලැබේ. පවුල තුලත්, කාර්යාලයේදීත්, සමාජයේදීත් බුදු දහම ජීවිතයට බද්ධ කර ගෙන, සාමාකාමී ලෝවක් බිහි කිරීමට ප්‍රාර්ථනා කර කටයුතු කරන එකමුතුවකි.

වර්තමානයේදී නිචිකෝ නිවානෝ ප්‍රධානීතුමාගේ මූලිකත්වයෙන්, සාමාජික සාමාජිකාවන් සෑම ධර්ම ව්‍යප්තියේ යෙදෙමින් අත් වැල් බැදගෙන සෑම රටකම සාම ක්‍රියාකාරකම් වල නියැලි සිටියි.


Living the Lotus
Vol. 199 (April 2022)

Senior Editor: Keiichi Akagawa
Editor: Jigjidkhorloo Gereltuya
Copy Editors: Ruklanthi Palipana,
Sahan Chamara , Rajitha Madurangha

*Living the Lotus* is published monthly
by Rissho Kosei-kai International,
Fumon Media Center, 2-7-1 Wada,
Suginami-ku, Tokyo 166-8537, Japan.
TEL: +81-3-5341-1124
FAX: +81-3-5341-1224
Email: living.the.lotus.rk-international@kosei-kai.or.jp

# එක් එක් පුද්ගලයා සඳහා වන කෘතඥතා - සලකුණ

නිචිකෝ නිවානෝ තුමා
ප්‍රධානී, රිෂ්ෂෝ කෝසෙයි සංවිධානය



## "ප්‍රසාදය පල කිරීම" හා එම කෘතඥතාවයේ මූලික ලක්ෂණය

අප නිතරම ප්‍රකාශ කරන පරිදි, අප සියලුම දෙනාටම මෙලොව උපන් දා සිට නොකඩවා සිදුවන දෙයක් දෙයක් වේ නම්, එය වනාහි ලෝකයේ පවත්නා සෑම සියලු දෙයකටම හෝ දෙනාටම "ප්‍රසාදය පල කිරීම" හා එමගින් සිදු කරන්නාවූ ජීවන රටා මාර්ගය වේ. මෙතැනදී, අප යමෙකු ගෙන් ඇසුවොත් ඔබ මෙවැනි කෘතඥතා පූර්වකව දෛනික ජීවිතයක් ගත කරනු ලබන්නේද යන්න, එවිට නොපැකිලි හා සෘජුව "ඔව්"යන ප්‍රති උත්තරය දෙනු ලබන පුද්ගලයන් ඉතාවිරල විය හැකිය. කාලගුණයට දෙස් දෙවුල් දුන්නද, තම පවුලට "ස්තූතියි" යන එක වචනයක් හෝ ප්‍රකාශ නොකරන පුද්ගලයන් සිටිනු ලබයි.

ෂඩ් පාරමිතා සූත්‍රයෙහි ප්‍රත්‍යක්ෂිත පූරණ බෝධිසත්ව චරියාවෙහි එක් ලක්ෂණයක් වන්නේ "ශිලය" යනුවෙන් උගන්වයි. "ශික්ෂාවන් රැකීම" යනුවෙන් සටහන් කරනු ලබන අතර, මෙය මූල භාෂාවන්හි "ශීල"යනුවෙන් ප්‍රකාශ වන අතර, එහි අර්ථය වනුයේ "යහපත් ගුණාංග පුරුදු කිරීම" වේ. "සිදු නොකල යුතු දේ" යන බලාත්මක හැඟීමක් උත්පාදනය වන්නාවූ මෙම "ශීල" ගුණාංගය, ඇත්ත වශයෙන් එය තමා මෙන්ම අන් අයද සතුටු කිරීමට කැමති බෝධිසත්ව චර්යා පිළිවෙතට සුදුසු ධනාත්මක අර්ථයක් ඇත.

මෙහිදී, පූර්ව ප්‍රකාශිත කරන ලද පරිදි ලෝකයේ පවත්නා සෑම සියලු දෙයකටම හෝ දෙනාටම "ප්‍රසාදය පල කිරීම" හා එමගින් සිදු කරන්නාවූ ජීවන රටා මාර්ගය යනුවෙන් සඳහන් බුද්ධ දේශණාවේ මූලයට, මහත් වූ සංබන්ධතාවක් දක්නට ඇත. තම ජීවන රටාව පවත්වා ගෙන යාමට උපකාර වන්නා වූ මුලු මහත් සියලුම දෙයට කෘතඥතාවය පල කිරීම, ඒ මඟින් සියල්ලම සන්තෘෂ්ඨියෙන් හා ප්‍රීතියෙන් ජීවන වීමට උත්සුක වීම බුද්ධ ප්‍රාර්ථනාව වන අතර, බෝධි සත්ව චරියාවේ අරමුණද වේ. මෙහිදී පෙන්වා දුන් "ප්‍රසාදය පල කිරීම" හා එම කෘතඥතාවයේ සලකුණ ලෙසට අප හට කල හැකි එකම දෙයනම්, අවම වශයෙන් අප ජීවත් වන හා අප වටා පිටාවේ සිටින ජනී ජනයා සැනසීම ලබා දීම වේ. සෑම තැනකම, සාමය හා සැනසීම ඇතිවීම ස්වභාව ධර්මයේ රැකවරණය සපුරාලීමද වේ. සෑම කෙනෙකුම සතුටු වන සහ ප්‍රීතිමත් පුරුදු ඇති කර ගැනීම සහ පුහුණු කිරීම යනු තම ජීවන රටාව පවත්වා ගෙන යාමට උපකාර වන්නා වූ මුලු මහත් සියලුම දෙයට කෘතඥතාවය පල කිරීමේ සිතුවිල්ලෙන් හට ගන්නාවූ "ශීලය" යන බෝධිසත්ව චරියාව වේ.

අප ගිහි බෞද්ධයන් සඳහා පිළිපැදිය යුතු ශික්ෂා පද ලෙසට ප්‍රාණඝාතනයෙන් වෙන්වීම, සොරකම් කිරීමෙන් වෙන්වීම, කාමයෙහි වරදවා හැසිරීමෙන් වෙන්වීම, මුසාවාදයෙන් වෙන්වීම, සුරාපානයෙන් වෙන්වීම යනුවෙන් ශික්ෂාවන් පහක් ඇත. මෙම ශික්ෂා පද පහම දෙසම අවධාරනය කර බලන විට පෙනී යන කරුණක් නම් තමා වටාපිටාවේ සිටින පුද්ගලයන්ට කරදර කම්කටලු එසේත් නැතිනම් හානියක් නොවන අයුරින් උපදෙස් දෙනු ලබන ආකාරය වේ. සියලුම ජීවිතවලට ගරු සරු දැක්වීම ඒවා මනාව ප්‍රයෝජනයට ගැනීම පවුලේ අය මිතුරන් සහ හිතවතුන් සමඟ මිත්‍ර වී සියලු දෙනාම සන්තෘෂ්ඨියෙන් ජීවත් වීම, මා සිතන අයුරු නම්, එය තමා පැත්තෙන් ගත් කලද, ඉතාමත් චිත්ත ප්‍රීතියට හේතු කාරණා වනවා නිසැකය

## තම තමා සතුව (තමාගේම ශික්ෂාවන්)

රොබෝ තාක්ෂණය පිළිබඳ අධිකාරියක් සහ බුදුදහම පිළිබඳ ගැඹුරු දැනුමක් ඇති මසහිරෝ මොරි විද්වතානන් පැවසුවේ "එක් එක් පුද්ගලයාගේ මුහුණ වෙනස් වන්නාසේම, තම පුරුදු සහ තමා දුර්වලතා වලද විවිධත්වයක් දක්නට ඇති නිසා, එක් එක් පුද්ගලයාගේ ශික්ෂාවන්ද වෙනස් වීම සිදුවේ" යැයි. පවසා ඇත. වෙනත් වචන වලින් කිවහොත් ඔබේම අභිරුචි-සාදන ලද "යහපත් පුරුදු = ශික්ෂා පද" සොයා ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීම වැදගත් වේයැයි හඟිමි.

එසේනම් පන්සිල් පද පහ ඇතුළු දැනට තමාට අවශ්‍ය යැයි සිතන පුරුදු ගැන යමක් සිතා බලමු. නිදසුනක් වශයෙන් පැමිණීම බොහෝ විට ප්‍රමාද හා අන් අයට එය කරදරයක් වන ලෙස හැසිරෙන පුද්ගලයකු, "පොරොන්දු වූ පරිදි විනාඩි පහක් වුවද කලින් පැමිණීම" යනුවෙන් නිතරම මුවින් ප්‍රකාශ කරන නිර්මාතෘ තුමාගේ පුරුද්ද ප්‍රයෝජනවත් විය හැකිය. එසේම, කෙටි සිත් ඇතිව ඉක්මන් කෝපය ඇති කරන පුද්ගලයෙක් "ඕංනිකොනිකො හරතත්සුමයි සොවකා හෙවත් ඕං මද සිනහවෙන් කෝපය නොනගේවා සවහා" මන්ත්‍රය ජප කර ආශ්වාසයක් ගැනීමේ පුරුද්ද, මම හිතන්නේ එය අවට ජීවත් වන පුද්ගලයන් අපහසුතාවයට පත් නොකිරීමට උපකාරී වන බවය.

සත්‍ය වශයෙන්, පුද්ගලයාගෙන් පුද්ගලයාට වෙනස් වන මෙම "ශික්ෂාවන්" දෘෂ්ටි කෝණයට අනුව සම්මතයන් සහ හැසිරීම් ලෙස හැඳින්විය හැක. එය හුදු ආචාර විධිවලට වඩා වෙනස් වන්නේ ක්‍රියාත්මක කරන ඒ ඒ පුද්ගලයාගේ සිත් සතන් තුල ඇති "ප්‍රසාදය පල කිරීම" හා ඒ සඳහා වන කෘතඥතාවයත්, සියලු දෙනාම මිත්‍ර ශීලීව, සහ සන්තෘෂ්ඨියෙන් ජීවත් වීම සඳහා වන යාච්ඤාව සහ ප්‍රාර්ථනා ඇති නිසා බවයි. තම වටපිටාවේ සමගිය ඇති කරන පරාර්ථකාමී හැඟීම් ඇති කරවන හදවත් ප්‍රීතිය ද භුක්ති විඳින අතර, ආත්මාර්ථකාමීත්වය සමඟ ඇතිවන බෝධිසත්ව චරියා මාර්ගය බවටද පත්වේ.

අප හිම බිමේ කියමනක් තියෙනවා වසන්තය පැමිනෙන්නේ ගස් වල මුල් අවටින් කියා. අවට වෙනත් ඕනෑම ස්ථානයකට පෙර, ගසෙහි මුල අවට හිම දියවීම සිදුවේ. එම සිදුවීම හිම මුල් විවරය ලෙසට හඳුන් වනු ලබයි. ඇත්ත වශයෙන් නිර්මාතෘ තුමාගේ උපන් ප්‍රදේශය වන සුගනුමා වල වසන්තය ගැන මතක් කරහොත්, එක පැත්තක හිම වල පාමුල පස් හරහා එබිකම් කළ දේවාල බිමෙහි සකුරා මල් දීප්තිමත් ලෙස පිපෙන්නට විය. එය සාමකාමී මතකයක් කරා ළඟා වනු ඇත.

අපි දෙවියන්ටත් බුදුන්ටත් කෘතඥ වී, ස්වභාව ධර්මයට අනුව සලකන ආකාරය සිතට ගෙන දෛනික සාමකාමී ජීවිතයක් ගත කිරීම සිදු කල යුතුවේ.

From *Kosei*, April 2022.

# මගේ ජීවිතය වෙනස් කල ඉගැන්වීම 'අන් අය ප්‍රථමයෙන්'

**චම්නබ් වොඑවුන්.**

**පුනොන්පෙන් ධර්ම ශාඛාව**

මම කාම්බෝජියාවේ පුනොන්පෙන් ධර්ම ශාඛාවේ චම්නබ් වොඑවුන්.

පියා චෙ ආ සවෝ එවුන්ටත්, මව පොච් ජෝඑම් ටත් දුව පවුලේ දෙවන දරුවා ලෙස, 1986 වර්ෂයේ ජූලි මස 27 වන දින, කාම්බෝජියාවේ අගනුවර වන පුනොන්පෙන් සිට කිලෝමීටර 300 ක් පමණ දුරින් පිහිටි බටම්බන් නගරයේදී උපත ලැබුවා. මට සහෝදරයෙක් සහ සහෝදරියක් ඉන්නවා.

මා ජපානයේ ගකුරින් පාසලට ඇතුල්වී 2014 වර්ෂයේ මාර්තු මස අධ්‍යාපනය අවසන් කලා. පසුව කාම්බෝජියාවට නැවත පැමිණි අතර, මේ වනවිට මා ජපන් අනුබද්ධ දේපල වෙළඳම් ආයතනයක රැකියාවක් කරමින් සිටිනවා. ආයතනයේ ප්‍රධානී තුමා ජපන් ජාතිකයකු වන බැවින්, භාෂා පරිවර්ථන කටයුතු, සේවක කලමනාකරණය සහ මූල්‍ය කලමනාකරණය වැනි ආයතනයේ විශාල වැඩ කොටසක් භාරව කටයුතු කරනවා. ජපන් භාෂාව කතා කල හැකි එකම කාර්ය මණ්ඩල සේවකයා මම වන බැවින්, ප්‍රධානී තුමාගේ විවිධ රාජකාරීන් සමග මා කාර්යබහුල වුවද, වැඩ කරන්නේ මහත් සතුටකිනි.

2009 වුරුද්දේ, මා පුනොන්පෙන් අසල විහාරස්ථානයක භික්ෂුවක් ලෙස පාසල් අධ්‍යාපනය හදාරමින් සිටි අතර, එහි ජ්‍යේෂ්ඨ භික්ෂූන් වහන්සේ නමක් වූ සොක් ඩලින් සාන් (වර්ථමානයේ සිවුරු ඇර සිටියි) ආරාධනාවකට අනුව මා රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ වැඩසටහනකට සම්බන්ධ වූවා. එය හේතු කොටගෙන මා රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට සම්බන්ධ වුනා.

එම වැඩසටහනේදී, අවුරුද්දකට කීපවතාවක්ම ධර්ම ව්‍යාප්ත කටයුතු සඳහා කාම්බෝජියාවට පැමිණෙන, කාර්යමණ්ඩල සාමාජිකයකු වන (එවකට අධ්‍යන කමිටුවේ සාමාජිකව සිටි) රෙජී උමෙත්සු සාන්, අපට සතුට ලඟාකර ගැනීම සඳහා මාර්ගය යන තේමාව යටතේ ධර්ම කරුණු ඉගැන්වූවා. එහිදී ඉගනගත් 'අන් අය ප්‍රථමයෙන්' යන වදන තදින් හිතට වැදුනා.

බොහෝ පිරිසක් දන්නා පරිදි, 1970 සිට 1993 අවුරුද්ද දක්වා කාලය තුල කාම්බෝජියාවේ දරුණු සිවිල් යුද්ධයක් පැවතියා. දිගු කලක් තිස්සේ යුද්ධය නිසා පීඩාවට පත්ව සිටි කාම්බෝජියානුවන් අන් අය ගැන සිතීම පසෙක ලා තමන් ගැන අවධානය යොමු කිරීමට හුරුව සිටියා.

අන් අය ගැන සිත සිතා සිටියහොත් තමාටත් ජීවත් වීමට නොහැකි වේවී යනුවෙන්, සිතාගෙන සිටි මා හට උමෙත්සු මහතාගෙන් ලැබුනු 'සතුට ලඟාකර ගැනීමටනම්, 'අන් අය ප්‍රථමයෙන්' යන හැඟීම වැදගත්' යන අවවාදය මට නැවුම් බවක් ගෙන ආවා. එම අද්දැකීමෙන් පසු, උමෙත්සු මහතා කාම්බෝජයට පැමිණි සෑම අවස්ථාවකම මා, බුදුන්වහන්සේගේ ධර්මය ප්‍රායෝගිකව පුරුදු පුහුණු කරන රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉගැන්වීම් ගැන ඉගෙන ගත්තා. එසේ සිටියදී මට ජපානයේ ගකුරින් පාසලට ගොස් අධ්‍යාපනය ලැබීමට අවස්ථාවක් ලැබිනි. ඇත්තටම, මාත් තාත්තත් අතර සම්බන්ධතාවය එතරම් සතුටුදායක නොවීය. කාම්බෝජියාවේ පැවති සිවිල් යුද්ධයේදී තාත්තා සොල්දාදුවකු ලෙස සේවයට බැඳී පවුලෙන් ඈතට ගියා. සිවිල් යුද්ධය අවසන් වුවත් දිගු කලක් ගතවනතුරුම තාත්තා නැවත නිවසට නොපැමිණි නිසා පවුලේ අය තාත්තා මිය ගොස් ඇතැයි සිතුවා. නමුත් එක් දිනක් හදිසියේම තාත්තා නැවත පැමිණියා. අපි ගොඩක් සතුටු වුනා. කෙසේ වෙතත්, යුධ සමයේ මතකයන් සමග සමහර විට තාත්තා ගෙදරම සිටියත්, වැඩි කතා බහක් නැතුව අපෙන් ඈත්ව ජීවත් වූවා. එනිසා තාත්තා නැවත පැමිණි සතුට ටිකෙන් ටික ගිලිහී ගොස් අසතුටක් බවට පත් වූවා.

සිවිල් යුද්ධය අවසන් වුවත් අපිට ජීවත් වීමට සිදු වූයේ දැඩි දුෂ්කරතාවයන් මැදය. මට වයස අවුරුදු 13 දී පාසල් අධ්‍යාපනය දිගටම කරගෙන යාම සඳහා පුනොන්පෙන් අසල



චම්නබ් වොඑවුන් සාන් (පුනොන්පෙන් වල නිවාස සංකීර්ණයක් ඉදිකරන වැඩබිමක සිට)

වූ පන්සලක ජීවත් වීමට තීරණය කලා. මහණ වුවහොත්, පාසල් ගස්තුවලින් නිදහස් වනවා සේම දයකයින්ගේ ආධාරවලින් ජීවත් වීමටත් හැකිවන නිසා එසේ කිරීමට තීරණය කලා.

කෙසේ වෙතත්, පාසල් උපකරණ තමා විසින් මිලදී ගැනිමට සිදු වූ නිසා යම් මුදලක් අවශ්‍ය විය. නමුත් තාත්තා මට අවුරුද්දටම ඩොලර් 25 ක් ලබා දුන්නා. එය ප්‍රමාණවත් නොවීම නිසා  සමහර දවස්වල පාසල් නොගිය අවස්ථාවන්ද තියනවා. එනිසා තාත්තා ගැන කළකිරීමක්ද ඇතිවූවා. දවසක්, සති දෙකකට කලින් තාත්තා පුනොන්පෙන් වලට ඇවිත් ගිය බව, ඥාතියකුගෙන් අසන්නට ලැබුණු අතර, ඒත් සමගම  මෙච්චර ලගට ඇවිල්ලත් මාව බලන්න ආවෙ නැනේ කියා කේන්ති ගියා. ඥාතී මිතුරාගේ මාර්ගයෙන් මට තාත්තාව බලන්න ඕන කියා පණිවිඩයක් යැවූ විට අවසානයේ තාත්තා මාව බලන්න අවා.

මෙච්චර ලගට ඇවිල්ලත් මාව බලන්න ආවෙ නැත්තේ ඇයි දැයි විමසූ විට, තාත්තා කිසිම පිළිතුරක් නොදී නිහඩවම සිටියා. ඒ වෙලාවේ මම දුක, වේදනාව, තනිකම හිතේ තද කරන් තරහෙන් පුපුරමින්, ‘තවදුරටත් මාව ඕන නැත්නම් මාවදල යන්න’ කියා පැවසූවා.

ඊට පසුව, මට බටම්බන් පලාතට යාම සදහා අවස්ථාවක් ලැබුනත්, තත්තාගේ මූණ බැලීමට තිබූ අකමැත්ත නිසා මම නැවත ගෙදර නොගොස් අසල පන්සලක නතර වූවා. ඒ වන විටත් මා සිතුවේ තාත්තා සමග මගේ සම්බන්ධයක් නෑ කියායි. ඒ තරමටම මම තාත්තාට වෛර කලා. කෙසේ වෙතත් කුමන හේතුවක් නිසාදෝ, නිර්මාතෘ තුමාගේ ඉගැන්වීමක් වන ‘අන් අය ප්‍රථමයෙන්’ යන්න හා ගකුරින් පාසලේදී ආදි මුතුන් මිත්තන් වෙනුවෙන් සූත්‍ර සජ්ජායනය කිරීමේ වැදගත්කම ඉගෙනගත් විට සෑම මොහොතකම සිහියට නැගුනේ මගේ තාත්තාගේ රුවයි.

2013 දී මා ගකුරින් අධ්‍යාපනය ලැබීම සදහා ජපානයේ තෝකියෝවෙහි ඕමෙ නගරයේ අලුත් ජීවිතයක් ආරම්භ කලා. ජපානයට ගිය පසු මා තුල ඇති වූ පළමු හැගීම නම්, ජපානය  කෙතරම් සුන්දරද යන්නයි. පාරවල් වල කුණු කසළ නොමැති අතර, නේවාසිකාගාරය අසලින් ගලායන ඇලෙහි වතුර ඉතාමත් පැහැදියි. එවැනි වටපිටාවක් තුල විවිධ සංස්කෘතීන්ට අයත් පිරිසක් සමග නේවාසිකාගරයක ජීවත් වීමට පටන් ගත් අතර රාජකාරීන් තුල එකිනෙකාට උදවු කරගනිමින්, කාලය ගත කලා. එහි ‘අන් අය ප්‍රථමයෙන්’ කියන ඉගැන්වීම හොදින් ප්‍රයෝගිකව පුහුණු කරන ලෝකයක් වූවා. ‘අන් අය ප්‍රථමයෙන්’ යන්න ප්‍රයෝගිකව පුහුණු කරන විට මෙතරම් විශිෂ්ඨ ලෝකයක් නිර්මාණය කරන්න පුලුවන් කියා දැණුනු අතර ඇස් ඉදිරි පිටම එය ඔප්පු වූවා.

මම ගකුරින් පාසලේ අධ්‍යාපනය ලබමින් සිටි කාලයේ, එතෙක් මගේ ජීවිතයේ ආත්මාර්ථකාමීවූ අවස්ථා ගැන පසු විපරම් කරන්න පටන් ගත්තා. එවිට, තාත්තා සමග ඇති බැදීම නැවත අලුත් කරගත යුතුයි කියා මට තදින්ම දැනුණා. එය තේරුම් යන විට, හැමදම වගේ මට තාත්තාව මතක් වෙන්න පටන් ගත්තා. එනිසා මම දවසක් හිතට ධෛර්ය ගෙන, ජපානයේ සිට තාත්තාට දුරකථනයෙන් කථාකලා.

දුරකථනයෙන්, තාත්තේ ඔයාට කොහොමද හොදින් ඉන්නවද? කියා මා ඇසූවිට, මහත් සතුටකින් ඔව්, මමනම් හොදින් ඉන්නවා කියා පිළිතුරු දී, ඔයාට කොහොමද හොදින් ඉගෙන ගන්නවද ජපානයේ ජීවිතය ප්‍රශ්නයක් නෑ නේද? යනුවෙන් මගෙන් විමසුවා. මම හොදින් ඉන්නවා. කිසිම ප්‍රශ්නයක් නෑ ලෙස මාද පිළිතුරු දුන්නා. එය ඉතා කෙටි සහ සරල සංවාදයක් වුවත්, මට විශාල සතුටක් වගේම ප්‍රබෝධයක් දැනුනා.

ගකුරින් අධ්‍යාපනය අවසන් කර මා නැවත කාම්බෝජයට පැමිණ නැවත වරක් මා තාත්තාට ස්තූතියි කිය පැවසූවා. නැවත තාත්තා සමග හොද සම්බන්ධතාවයක් ගොඩනගා ගැනීමට හැකි වීම නම් පිනක්. 2021 අවුරුද්දේ, තාත්තා ඔහුගේ ඉතිරි ජීවිත කාලය නිදහසේ ගතකල යුතුයි කියා පවසා පැවිදි වූවා. මා පැවිදිව



මහන වූ තම පියා සමග (බටම්බන් හි මහගෙදර සිට )

සිටි කාලයේ තාත්තා මට ජීවන වියදමට මුදල් ලබාදුන් ආකාරයටම මා දැන් පැවිදි වූ තාත්තාට මාසිකව මුදල් යවනවා.

රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයට මා සම්බන්ධ වී මුලින්ම ඉගෙනගත් , නිර්මාතෘ තුමාගේ ඉගැන්වීමක් වන 'අන් අය ප්‍රථමයෙන්' යන්න මගේ හදවතට කාවැදුණු ජීවිතයේ ලැබුනු හොදම මාර්ගෝපදේශයකි.

2018 අවුරුද්දේදී මගේ රැකියා ස්ථානයේදී හමු වූ මගේ බිරිද සමග විවාහ වූ අතර, අප දෙදෙනාට දුවෙක් ඉපදුනා.

වර්ථමානය වනවිට මා නිවස තුල 'අන් අය ප්‍රථමයෙන්' යන්න පුහුණුවේ යෙදෙමින් බිරිදත්, දියණියත් සමග හොද පවුල් ජීවිතයක් ගත කරනවා. ඇත්තටම මා, නිර්මාතෘ තුමාගේ මගපෙන්වීමක් වන යමෙක් කතා කල විට 'ඔව්' ලෙස සතුටු සිතින් පිළිතුරු දීමට, බිරිදට සහ දියණියට ආදරණීය වචන වලින් කතාකිරීමට හදවතින්ම උත්සහ කරනවා. නමුත් සමහර වෙලාවට බිරිද කතා කරන අවස්ථාවලදී 'ඔව්' වෙනුවට 'හ්ම්' ලෙස පිළිතුරු දෙන අවස්ථාද තිබෙනවා. එහෙම අවස්ථා වලදී මගේ දුව පැමිණ 'තාත්තේ 'හ්ම්' නෙවෙයි 'ඔව්' නේද' කියා මට මග පෙන්වනවා. මුල් කාලයේ මා බිරිදටත් දියනියටත් 'අන් අය ප්‍රථමයෙන්' යන්න උගන්වා ප්‍රායෝගිකව පුහුණු කිරීම පුරුද්දක් බවට පත් කල නමුත්, මෑතක සිට බිරිදත් දියණියත් දෙදෙනා 'අන් අය ප්‍රථමයෙන්' යන්න මට මතක් කර දෙන තැනට පත්ව සිටිනවා. ඇත්තටම එයට මා ස්තූතිවන්ත වෙමි.

මා මුලින් සදහන් කල පරිදි, මේ වන විට මා ජපන් අනුබද්ධ දේපල වෙලදම් ආයතනයක සේවය කරන අතර, දිනපතා කාර්යබහුල වුවත් සතුටින් සිටිනවා. තවද ප්‍රමාණවත් වැටුපක්ද ලැබෙනවා. මම මෙ ජීවිතය සරලව ගත කිරීමට උත්සහ කරනවා. මගේ වැටුපෙන් කොටසක්, මගේ දෙමාපියන්ගේ නිවස අසලින් හිස් ඉඩමක් ගැනීම සදහා වැය කරනවා. හැමදෙනාගේම ආශිර්වාදයෙන් මේවන විට ටිකක් විශාල ඉඩමක් අපට තිබෙන අතර, එහි විශාල සේවක පිරිසක් සේවය කරන ගොවිපලක් පවත්වාගෙන යනවා. එහි අස්වනු නෙළන කාලයට මමද රැකියාවේ නිවාඩු ලබාගෙන ගොවිපලට ගොස් සේවකයින් සමග එකට මහන්සි වී අස්වනු නෙළනවා. මම ගොවිපල තවදුරටත් පුළුල් කර ප්‍රදේශවාසීන් විශාල ප්‍රමාණයකට රැකියා ලබාදි ස්වාධීන හා ස්ථාවර ජීවිතයක් ගත කිරීමට උත්සහ කරමින් සිටිනවා. එසේ කර, ගොවිපලේම පාසලක් ඉදිකර සේවකයින්ගේ දරුවන්ට හොදින් ලෝකයට මුහුණදීමට හැකි හොද අධ්‍යාපනයක් ලබා දී, කාම්බෝජ ජනතාවගේ සතුට සදහා හොද මානව සම්පතක් සංවර්ධනය කිරීමට මා අධිෂ්ඨාන කරමි.

මගේ ජීවිතය වෙනස් කල 'අන් අය ප්‍රථමයෙන්' යන උදාර ඉගැන්වීම අපට අවබෝධ කර දීමට කටයුතු කල නිර්මාතෘ තුමාට හදවතින්ම ස්තූතිවන්ත වෙමි.



පවුලේ අය සමග
(පුනොන්පෙන් වට පිහිටි මගේ නිවසේ වහලය උඩ සිට)

# රිෂ්ෂෝ කෝසෙයි කායි හැඳින්වීම

## නික්යෝ නිවානෝ තුමාගේ ජීවිත කතාව සහ රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ ඉතිහාසය.

## නිර්මාතෘ තුමාගේ අභාවප්‍රාප්තිය

ලෝක සාමය උදාකර ගැනීම සඳහා තම ජීවිත කාලය කැප කල රිෂ්ෂෝ කෝසෙයි කායි සංවිධානයේ නිර්මාතෘ, 1999 අවුරුද්දේ ඔක්තෝබර් මස 04 වන දින අවුරුදු 92 ක් ආ ජීවිත ගමන අවසන් කර අභාවප්‍රාප්ත විය.

අවමංගල්‍ය උත්සවය සඳහා සාමජිකයින් ඇතුළු ආගමික, දේශපාලනික හා ව්‍යාපාරික පිරිස් ද එකතුව 60,000 ක් පමණ පිරිස අවසන් ගෞරව දැක්වීම සඳහා පැමිණියා.

නිචිකෝ නිවානෝ තුමා, තම පියා මෙන්ම ගුරුවරයකුද වූ නිර්මාතෘ තුමා ගැන ගුණ කථනයක් කල අතර, තම කෘතඥතාවය සහ මින් ඉදිරියට කැප වන බව ප්‍රකාශ කලා.



ඔබේ දැනුමට

ඔක්තෝබර් 10 වන දින ජපානයේ මූලස්ථාන ධර්ම මන්දිරයේ දී පැවති අවමංගල්‍ය සහ සමු දීමේ උත්සවයේ දී, එෂින් වතනබේ, ෂින්තාරෝ ඉෂිහරා, දීප්තිමත් සමාජයක් ගොඩනැගීම සඳහා වන ජාතික කවුන්සිලයේ සභාපති සෙයිචි ශිරයානාගි මෙන්ම ලෝක සාමය සඳහා වූ ලෝක ආගමික සම්මේලනයේ සභාපති ඇතුළු පිරිසද තම බලවත් ශෝකය ප්‍රකාශ කලා.




※කරුණාකර අවසරයකින් තොරව නැවත මුද්‍රණය කිරීමෙන් වළකින්න.

# නිච්කෝ නිවානෝ තුමා



නිච්කෝ නිවානෝ තුමා සාමාජිකයින්ගේ සතුට හා ලෝක සාමය සාක්ෂාත් කර ගැනීම සඳහා කැපවෙමින් දිනපතා කාර්යබහුල ජීවිතයක් ගත කරමින් සිටියි.

ජපානයේ මූලස්ථානයේ ප්‍රධාන ධර්ම මන්දිරයේ උත්සව වලට සහභාගී වී ධර්මය දේශනා කරමින්, රට පුරා ධර්ම ශාඛාවන්ට ගොස් සූත්‍ර සජ්ජායනය කරමින් සහ ධර්ම ශඛාවන් හි බුද්ධ ප්‍රතිමාවන් තැන්පත් කරමින් කටයුතු කරයි.

තවද, විවිධ ආගමික නායකයින් සමග ලෝක සාමය ගැන සාකච්චා කරමින් කටයුතු කරනවා. මීට අමතරව, එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සම්මන්ත්‍රණ තුල තනතුරක් දරමින්, ලෝක ආගම් සමග සම්මන්ත්‍රණ වලට සම්බන්ධ වී ලෝක සාමය සාක්ෂාත් කරගැනීම සඳහාද ක්‍රියාකාරීව කටයුතු කරයි.

දැනුමෙන් පරිපූර්ණ කරුණාවන්ත හදවතකින් යුත් නිවානෝ තුමාගේ චරිතයට සාමාජිකයින් මහත් ලෙස ගෞරව කරති.




ඔබේ දැනුමට

නිච්කෝ නිවානෝ තුමා, ලෝක සාමය සඳහා ආගමික සමුළුවේ ජපානයේ සභාපති සහ ජාත්‍යන්තර කමිටුවේත්, ආසියානු ආගමික සාම කවුන්සිලයේත් සභාපති, මෙන්ම ජපානයේ නව ආගමික සම්මේලනයේ උපදේශක වැනි වැදගත් තනතුරු දරමින් සිටිනවා.

# Rissho Kosei-kai: A Global Buddhist Movement




**Rissho Kosei-kai Buddhist Church of Hawaii**
2280 Auhuhu Street, Pearl City, HI 96782, USA
TEL: 1-808-455-3212 FAX: 1-808-455-4633
Email: sangha@rkhawaii.org URL: http://www.rkhawaii.org

**Rissho Kosei-kai Maui Dharma Center**
1809 Nani Street, Wailuku, HI 96793, USA
TEL: 1-808-242-6175 FAX: 1-808-244-4625

**Rissho Kosei-kai Kona Dharma Center**
73-4592 Mamalahoa Highway, Kailua-Kona, HI 96740, USA
TEL: 1-808-325-0015 FAX: 1-808-333-5537

**Rissho Kosei-kai Buddhist Center of Los Angeles**
2707 East First Street, Los Angeles, CA 90033, USA
TEL: 1-323-269-4741 FAX: 1-323-269-4567
Email: rk-la@sbcglobal.net URL: http://www.rkina.org/losangeles.html

Please contact Rissho Kosei-kai Buddhist Center of Los Angeles
**Rissho Kosei-kai Buddhist Center of Arizona**
**Rissho Kosei-kai Buddhist Center of Colorado**
**Rissho Kosei-kai Buddhist Center of San Diego**
**Rissho Kosei-kai Buddhist Center of Las Vegas**
**Rissho Kosei-kai Buddhist Center of Dallas**

**Rissho Kosei-kai of San Francisco**
(Address) 1031 Valencia Way, Pacifica, CA 94044, USA
(Mail) POBox 778, Pacifica, CA 94044, USA
TEL: 1-650-359-6951 Email: lotusbuddhist@gmail.com
URL: https://sf-buddhism.org/

Please contact Rissho Kosei-kai of San Francisco
**Rissho Kosei-kai of Sacramento**
**Rissho Kosei-kai of San Jose**

**Rissho Kosei-kai of New York**
320 East 39th Street, New York, NY 10016, USA
TEL: 1-212-867-5677 Email: rkny39@gmail.com URL: http://rk-ny.org

**Rissho Kosei-kai of Chicago**
1 West Euclid Ave., Mt. Prospect, IL 60056, USA
TEL: 1-773-842-5654
Email: murakami4838@aol.com URL: http://rkchi.org

**Rissho Kosei-kai of Fort Myers**
URL: http://www.rkftmyersbuddhism.org

**Rissho Kosei-kai Dharma Center of Oklahoma**
(Address) 2745 N.W. 40th St., Oklahoma City, OK 73112, USA
(Mail) POBox 57138, Oklahoma City, OK 73157, USA
TEL: 1-405-943-5030 FAX: 1-405-943-5303
Email: rkokdc@gmail.com URL: http://www.rkok-dharmacenter.org

**Rissho Kosei-kai Dharma Center of Dayton**
617 Kling Drive, Dayton, OH 45419, USA
URL: http://www.rkina-dayton.com

**The Buddhist Center Rissho Kosei-kai International of North America (RKINA)**
2707 East First St., Suite #1, Los Angeles, CA 90033, USA
TEL: 1-323-262-4430 FAX: 1-323-269-4567
Email: info@rkina.org
URL: https://www.buddhistcenter-rkina.org

**Rissho Kosei-kai of Vancouver**
Please contact RKINA

**Rissho Kosei-kai International**

**Rissho Kosei-kai Buddhist Center of San Antonio**
(Address) 6083 Babcock Road, San Antonio, TX 78240, USA
(Mail) POBox 692148, San Antonio, TX 78249, USA
TEL: 1-210-558-4430 FAX: 1-210-696-7745
Email: dharmasanantonio@gmail.com
URL: http://rksabuddhistcenter.org

**Rissho Kosei-kai of Seattle's Buddhist Learning Center**
28621 Pacific Highway South, Federal Way, WA 98003, USA
TEL: 1-253-945-0024 Email: rkseattlewashington@gmail.com
URL: http://buddhistlearningcenter.org

**Risho Kossei-kai do Brasil**
Rua Dr. José Estefno 40, Vila Mariana, São Paulo-SP, CEP 04116-060, Brasil
TEL: 55-11-5549-4446, 55-11-5573-8377
Email: risho@rkk.org.br URL: http://www.rkk.org.br

**在家佛教韓国立正佼成会　Korean Rissho Kosei-kai**
〒 04420 大韓民国 SEOUL 特別市龍山區漢南大路 8 路 6-3
6-3, 8 gil Hannamdaero Yongsan gu, Seoul, 04420, Republic of Korea
TEL: 82-2-796-5571　FAX: 82-2-796-1696

**在家佛教韓国立正佼成会釜山支部**
**Korean Rissho Kosei-kai of Busan**
〒 48460 大韓民国釜山廣域市南區水營路 174, 3F
3F, 174 Suyoung ro, Nam gu, Busan, 48460, Republic of Korea
TEL: 82-51-643-5571　FAX: 82-51-643-5572

**社團法人在家佛教立正佼成會　Rissho Kosei-kai of Taipei**
台湾台北市中正區衡陽路 10 號富群資訊大厦 4 樓
4F, No. 10, Hengyang Road, Jhongjheng District, Taipei City 100, Taiwan
TEL: 886-2-2381-1632, 886-2-2381-1633　FAX: 886-2-2331-3433

**台南市在家佛教立正佼成會　Rissho Kosei-kai of Tainan**
台湾台南市東区崇明 23 街 45 號
No. 45, Chongming 23rd Street, East District, Tainan City 701, Taiwan
TEL: 886-6-289-1478　FAX: 886-6-289-1488
Email: koseikaitainan@gmail.com

**Rissho Kosei-kai South Asia Division**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Kathmandu**
Ward No. 3, Jhamsikhel, Sanepa-1, Lalitpur, Kathmandu, Nepal

**Rissho Kosei-kai Society of Kolkata**
89 Srirampur Road (VIP), Garia, Kolkata 700084, India

**Rissho Kosei-kai of Kolkata North**
AE/D/12 Arjunpur East, Teghoria, Kolkata 700059,
West Bengal, India

**Rissho Kosei-kai of Bodhgaya Dharma Center**
Ambedkar Nagar, West Police Line Road, Rampur, Gaya-823001,
Bihar, India

**Rissho Kosei-kai of Patna Dharma Center**
Please contact Rissho Kosei-kai Society of Kolkata

**Rissho Kosei-kai of Central Delhi**
77 Basement D.D.A. Site No. 1, New Rajinder Nagar,
New Delhi 110060, India

**Rissho Kosei-kai of Singapore**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Phnom Penh**
W.C. 73, Toul Sampaov Village, Sangkat Toul Sangke, Khan Reouseykeo,
Phnom Penh, Cambodia

**RKISA Rissho Kosei-kai International of South Asia**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8141　FAX: 66-2-716-8218

**Rissho Kosei-kai of Bangkok**
Thai Rissho Friendship Foundation
201 Soi 15/1, Praram 9 Road, Bangkapi, Huaykhwang, Bangkok 10310, Thailand
TEL: 66-2-716-8216　FAX: 66-2-716-8218　Email: info.thairissho@gmail.com

**Rissho Kosei Dhamma Foundation**
No. 628-A, Station Road, Hunupitiya, Wattala, Sri Lanka
TEL: 94-11-2982406　FAX: 94-11-2982405

**Rissho Kosei-kai of Polonnaruwa**
Please contact Rissho Kosei Dhamma Foundation

**Rissho Kosei-kai Bangladesh**
85/A Chanmari Road, Lalkhan Bazar, Chittagong, Bangladesh
TEL: 880-2-41360470

**Rissho Kosei-kai Mayani**
Mayani Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Damdama**
Damdama Barua Para, Mirsarai, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Satbaria**
Village: Satbaria Bepari Para, Chandanaih, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Chendhirpuni**
Village: Chendhirpuni, P.O.: Adhunogar, P.S.: Lohagara, Chittagong,
Bangladesh

**Rissho Kosei-kai Raozan**
Dakkhin Para, Ramzan Ali Hat, Raozan, Chittagong, Bangladesh

**Rissho Kosei-kai Laksham**
Village: Dhupchor, Laksham, Comilla, Bangladesh

**Rissho Kosei-kai Dhaka North**
408/8 DOSH, Road No 7 (West), Baridhara, Dhaka, Bangladesh

**Rissho Kosei-kai Cox's Bazar**
Ume Burmize Market, Tekpara, Sadar, Cox's Bazar, Bangladesh

Please contact Rissho Kosei-kai Bangladesh
**Rissho Kosei-kai Patiya**
**Rissho Kosei-kai Ramu**
**Rissho Kosei-kai Aburkhil**

**Buddiyskiy khram "Lotos"**
4 Gruzinski Alley, Yuzhno-Sakhalinsk 693005, Russia
TEL: 7-4242-77-05-14

**Rissho Kosei-kai of Hong Kong**
Flat D, 5/F, Kiu Hing Mansion, 14 King's Road, North Point, Hong Kong, China

**Rissho Kosei-kai Friends in Shanghai**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai of Ulaanbaatar**
(Address) 15F Express Tower, Peace avenue, khoroo-1, Chingeltei district,
Ulaanbaatar 15160, Mongolia
(Mail) POBox 1364, Ulaanbaatar-15160, Mongolia
TEL: 976-70006960　Email: rkkmongolia@yahoo.co.jp

**Rissho Kosei-kai of Erdenet**
Please contact Rissho Kosei-kai International

**Rissho Kosei-kai di Roma**
Via Torino, 29, 00184 Roma, Italia
TEL/FAX: 39-06-48913949　Email: roma@rk-euro.org

Please contact Rissho Kosei-kai di Rome
**Rissho Kosei-kai of Paris**
**Rissho Kosei-kai of Venezia**

**Rissho Kosei-kai of the UK**
29 Ashbourne Road, London W5 3ED, UK
TEL: 44-20-8933-3247　Email: info@rkuk.org　URL: https://www.rkuk.org
Facebook: https://www.facebook.com/rkuk.official
Twitter: https://twitter.com/rkuk_official
Instagram: https://www.instagram.com/rkuk_official

**Rissho Kosei-kai International Buddhist Congregation (IBC )**
166-8537 東京都杉並区和田 2-7-1 普門メディアセンター 3F
Fumon Media Center 3F, 2-7-1 Wada, Suginami-ku, Tokyo 166-8537, Japan
TEL: 03-5341-1230　FAX: 03-5341-1224　URL: http://www.ibc-rk.org

**Published by Rissho Kosei-kai International**